සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**වර්ෂ අවසාන ඇගයීම - 2013**

1090

**7 - ශ්‍රේණිය**

**නාට්‍ය හා රංග කලාව**

**නම/විභාග අංකය :-** ................................................................................ **කාලය : පැය 01 මි. 30යි.**

## I කොටස

✲ **1 සිට 5 දක්වා ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. ශ්‍රී ලංකාව පිළිබඳ ඓතිහාසික කතා පුවත් දක්නට ලැබෙන ග්‍රන්ථයක් වන්නේ,
1. දීප වංශය 2. පිරිත් පොත 3. කව්සිළුමිණ 4. ජාතක පොත

02. ''කටේ කිරි සුවඳ යන්නට පවා බැරි වුණා'' ගීතයෙන් කියවෙන වීර චරිතය වන්නේ,
1. දුටුගැමුණු රජු 2. වළගම්බා රජු 3. ටිකිරි කුමරු 4. මද්දුම බණ්ඩාර කුමරු

03. රංගනයේ දී නළු නිළියන් භාවිත කරන භාණ්ඩ,
1. රංගාභරණ 2. රංග වස්ත්‍ර 3. රංග භාණ්ඩ 4. වේෂ භූෂණ

04. රංගාභරණ සැකසීමේ දී සැලකිය යුතු කරුණක් නොවන්නේ,
1. පහසුවෙන් පැළඳිය හැකි බව. 2. පහසුවෙන් ගලවාගත හැකි බව.
3. සැහැල්ලු බව 4. කුඩාවට සකස් කළ යුතු බව.

05.



ඉහත රූපයේ දැක්වෙනුයේ,
1. අඬන මුහුණකි. 2. බිය වූ මුහුණකි. 3. සිනාසෙන මුහුණකි. 4. පුදුම වූ මුහුණකි.

✲ **'A' තීරුවේ පිළිතුරට ගැළපෙන පිළිතුර 'B' තීරුවෙන් තෝරා යා කරන්න.**

| 'A' | 'B' |
|---|---|
| 06. මනමේ | සෝමලතා සුබසිංහ |
| 07. පොල්ගෙඩියට ජරමරේ | නන්දන අල්ගෙවත්ත. |
| 08. අමර ගියා දිව්‍ය ලෝකේ | චන්ද්‍රසේන දසනායක |
| 09. පුංචි අපට දැන් තේරෙයි | පාලිත ලොකුපෝතාගම |
| 10. ටිකිරි මැණිකේ | එදිරිවීර සරච්චන්ද්‍ර |

✲ **ගැළපෙන පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

11. නාට්‍යයක රූපණ කාර්යයේ දී ................................................................ ප්‍රයෝජනයට ගනු ලැබේ.
12. ශරීරය සැහැල්ලු කිරීමේ අභ්‍යාස ................................................................ නම් වේ.
13. වචන භාවිතයෙන් තොරව අවස්ථා නිරූපණය කිරීම ................................................................ රංගනය වේ.
14. ජන ක්‍රීඩාවල නිරත වීමෙන් ................................................................ ශක්තීන් වර්ධනය වේ.
15. හැඟීම් අන්‍යයන්ට දැනෙන සේ පෙන්වීම ................................................................ ප්‍රකාශනය ලෙස හැඳින්වේ.

(භාව, අභිරූපණ, කායික හා මානසික, ශරීරය හා මනස, ශිථිලකරණ)

※ **16 - 20 දක්වා ප්‍රශ්න සඳහා හරි නම් '✓' ලකුණ ද වැරදි නම් 'X' ලකුණ ද යොදන්න.**

16. නාට්‍යයක් සඳහා නළු නිළියන් තෝරාගැනීම නළුවරණය නම් වේ. ( )
17. නාට්‍යෝචිත අවස්ථා තුළ කුතුහලයක් තිබේ. ( )
18. නාට්‍යයේ කතා වස්තුව තුළින් මතුවන ප්‍රධාන අදහස තේමාව වේ. ( )
19. ළමා නාට්‍ය නැරඹීමෙන් උසස් රසවින්දනයක් ලබාගත නොහැක. ( )
20. වෙස් මුහුණු පැලඳීම මගින් දක්වන්නේ ස්ථාවර භාව ප්‍රකාශනයකි. ( )

(ලකුණු 20 × 1 = 20)

## II කොටස

※ **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

01. පහත සංවාද කොටස අතරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මිලිපිලි - ඒ උණාට ටිකිරි මැණිකේගේ කතාව කියන සැම වෙලාවෙම මට ඇඬෙනවා.

එමිල් - ඒකට මොනවා කරන්න ද? ( ලේන්සුව ගෙන ෂොකලොක්ට දෙමින් ) මෙන්න.

මිලිපිලි - ඒයිය ලැජ්ජ නැද් ද? ඕක හොඳට ම හපුටුයිනේ (තම ලේන්සුව දෙමින්) ආ මෙන්න මේක ගන්න.

පිලිප් - ඔව්, ඕකෙන් පුළුවන් හොඳට හොටු හුරන්න. (කර පෙන්වමින්) මෙන්න මෙහෙම.

මිලිපිලි - ආ ං .............. ඔය ඇති. දැන් අපිට ඒ කතාව කියන්න.

ෂොකලොක් - (හැඩීම නවතා) ඔන්න එහෙනං හොඳට අහගෙන ඉන්න ඕනෑ. ටිකිරි මැණිකේ පුංචි හොඳ කෝච්චියක්. මං තමයි ඒකේ එන්ජින් ඩ්‍රයිවර්.

(i) මෙම දෙබස සඳහන් නාට්‍යය සහ එහි සිංහල අනුවාදකයා කවු ද? (ලකුණු 01)
(ii) ඉහත දෙබසේ දැක්වෙන රංග විධාන දෙකක් නම් කරන්න. (ලකුණු 02)
(iii) ඉහත දෙබසේ එන චරිත තුනක් නම් කරන්න. (ලකුණු 03)
(iv) මෙම දෙබසෙහි සඳහන් ක්‍රියාවන් දෙකක් සහ හැඟීම් දෙකක් නම් කරන්න. (ලකුණු 02)
(v) මෙම නාට්‍යයෙන් සමාජයට දෙන පණිවුඩයක් ලියන්න. (ලකුණු 02)

02. (i) ආනුෂාංගික ශිල්ප නම් කරන්න. (ලකුණු 05)
(ii) ඉන් එකක් පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 05)

03. (i) ළමා නාට්‍ය වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 04)
(ii) ළමා නාට්‍යයක දක්නට ලැබෙන ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 06)

04. (i) ඔබ පාසලේ ඉගෙනගත් රංග අභ්‍යාස තුනක් ලියන්න. (ලකුණු 03)
(ii) ඉන් එකක් සිදු කරන ආකාරය විස්තර කර එමගින් ඔබට ලැබුණු ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 07)

05. (i) අභිරූපණය යනු කුමක් ද? (ලකුණු 04)
(ii) අභිරූපණයක ලක්ෂණ තුනක් නම් කරන්න. (ලකුණු 06)

06. "ශිෂ්‍යයින් පිරිසක් අධ්‍යාපන චාරිකාවක් සඳහා ඓතිහාසික ස්ථාන නැරඹීමට ගිය විට ඓතිහාසික වීර චරිතයකට පණ ඇවිත් ශිෂ්‍යයින් අමතයි" මෙම සිදුවීම ඇසුරින් කෙටි නාට්‍යයක් ලියන්න. (ලකුණු 10)